# ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා පිළිබඳ නොමියෙන මතක සටහන්



ලයනල් බෝපගේ

දිවංගත ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා පිළිබඳව මා දැනුවත් බවට පත් වන්නේ 1956 සමාජ පෙරළියේ දී ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ආසනය නියෝජනය කරමින් කරන ලද විශාල වැඩ කටයුතු සම්භාරය හේතුවෙනි. 1956 පිහිට වූ මහජන එක්සත් පෙරමුණේ සම ලේකම්වරයකු වූ ඔහු එස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක මහතාගේ සහ පිලිප් ගුණවර්ධන



සහෝදරයාගේ සමකාලීනයෙකු ද අනුගාමිකයකු ද විය. 1960 මාර්තු මහ මැතිවරණයේදි මහජන එක්සත් පෙරමුණෙන් හබරාදුව ආසනය තරග කොට වැඩි ඡන්ද සියයකින් පමණ ජය ගත් නමුත් 1960 ජුලි මහ මැතිවරණයේ දී ඔහු පරාජයට පත් විය. 1965 මහ මැතිවරණයේ දී ස්වාධීන වාමාංශික මතධාරි අපේක්ෂකයකු ලෙස තරඟ කොට යලිත් වැඩි ඡන්ද සියයකින් පමණ ජය ගත් ඔහු 1970 මහ මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමඟි පෙරමුණෙන් තරඟ කොට විශිෂ්ට ජයග්‍රහණයක් අත් කර ගත්තේය. මේ මැතිවරණවල දී ඔහු දැක්වූ දේශපාලන අධිෂ්ඨානය අප බාල කාලයේ පවා අපේ සතුටට හේතු වී තිබුනි. කෙසේ වෙතත්, වාමාංශික ප්‍රගතිශීලී මෙන්ම සිංහල ජාතිකවාදී අදහස් වල සංකලනයක් ලෙස නම් කළ හැකි මතවාදයක් ඔහු දරා සිටි බව මගේ අදහසයි.

1971 අප්‍රේල් නැගිටීමට සහභාගි වූ දහස් ගණන් තරුණ තරුණියන් කෙරෙහි ඔහු දැක් වූ ආකල්පය ඒ කාලයේ පාර්ලිමේන්තුව තුල සිටි වාමාංශිකයන් ලෙස පෙනී සිටි බොහෝ මන්ත්‍රීවරුන් දැක් වූ ආකල්පයට වඩා බෙහෙවින් වෙනස් වූයේය. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ පවරා තිබූ "මහ නඩුවේදී රජයට එරෙහිව පෙනී සිටි රෝහණ සහෝදරයා ඇතුළු අප කණ්ඩායම කෙරෙහි ප්‍රින්ස් සහෝදරයා දැක් වූ ආකල්පය සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ මෙන්ම ආණ්ඩු පක්ෂයේ සිටි බොහෝ වාමාංශික නායකයන්ගේ ද අප්‍රසාදයට හේතු වී තිබිණි. නීතිපති වික්ටර් තෙන්නකෝන්, නියෝජ්‍යසොලිසිටර් ජෙනරාල් පර්සි කොලින් තෝමෙ, අධිනීතිඥ රංජිත් අබේසූරිය, වර්තමාන විදේශ කටයුතු ඇමති නීතිඥ තිලක් මාරපන සහ සුප්‍රකට අග්‍ර විනිශ්චයකාරවරයකු බවට පසුව පත් වූ සරත් එන්. සිල්වා යන මහත්වරු "මහ නඩුවේ, පැමිණිල්ල මෙහෙයවූහ.

මහ රැජිනට එරෙහිව යුද්ධ කිරීමට කුමන්ත්‍රණය කිරීම, යුද වැදීම හා/හෝ අනුබල දීම සහ ලංකාණ්ඩුව සාපරාධී ලෙස බලය යොදවා බිය වැද්දීමට කුමන්ත්‍රණය කිරීම යන චෝදනා යටතේ එකල පැවති රජය 41 දෙනකුට එරෙහිව චෝදනා ගොනු කල අවස්ථාවේ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ නීත්‍යනුකූල භාවය පිළිබඳව අභියෝග කරන්නට ඉදිරිපත් වූ නීතිඥ කණ්ඩායම අතර අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා ප්‍රමුඛයෙකු විය. එකල අධිකරණ ඇමතිව සිටි ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතාගේ උපදෙස් අනුව කටයුතු කළ කොමිෂන් සභාවේ අසාමාන්‍ය ක්‍රියා පටිපාටියට එරෙහිව විරෝධය පා නැඟිට ගිය නීතිඥ කණ්ඩායම අතර ද ඔහු ප්‍රමුඛත්වය දැරීය. අපරාධ යුක්ති විනිශ්වය කොමිෂන් සභාවේ සභාපති වූ අග්‍ර විනිශ්වයකාර එච් එන් ප්‍රනාන්දු මහතා එසේ විරෝධය පා නැඟිට ගිය නීතිඥයන් කිසිවකුට අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ පෙනී සිටීම තහනම් කලේය.

අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත යටතේ ගත හැකිව තිබුනු අත්තනෝමතික ක්‍රියාමාර්ග පිළිබඳව රජයේ සිටි ඇතැම් කණ්ඩායම් තුල පවා, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (මොස්කව් පිල) තුළ, දැඩි අස හනකාරී තත්වයක් පැන නැඟී තිබුනි. කොමියුනිස්ට් පක්ෂයටත් ලංකා සම සමාජ පක්ෂයටත් සිය තරුණ පක්ෂ සාමාජිකයන් අතරින් පැන නැමේන් තිබුන ප්‍රශ්න පාලනය කර ගත නොහැකිව තිබිණි. ජනතා විමුක්ති පෙරමුණට ආධාර නොකල නමුත් ඔවුහු අපරාධ යුක්ති විනිශ්වය කොමිෂන් සභා පණත සහ ආණ්ඩුව වැඩි දියුණු කල හදිසි නීති බලතල යොදා ගැනීම පිළිබඳව භීතියට පත්ව සිටියහ.
මේ අතර ලංකා වෙළඳ සේවක සංගමයේ ප්‍රධාන ලේකම් අධිනීතිඥ බාලා තම්පෝ සහ ප්‍රින්ස් ගුණසේකර වැනි සහෝදරවරුන් ද, තවත් ස්වාධීන කණ්ඩායම් ද රජයේ කෲර මර්දනය පිළිබඳ තොරතුරු ලෝකයා හමුවේ හෙළිදරව් කරමින් සිටියහ. ප්‍රින්ස් සහෝදරයා බ්‍රිතාන්‍ය සාමි මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු සහ මානව අයිතීන් පිළිබඳ ඉහළ පෙලේ ක්‍රියාකාරිකයෙකු ව සිටි ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ ඇවර්බරි සාමිවරයා සංචාරයක් සඳහා ලංකාවට ගෙන්වා ගෙන තිබුණේය. ඔවුන් දෙදෙනා සමඟ බාලා තම්පෝ සහෝදරයා ද රජයේ මර්දනයට ලක්ව විනාශයට ලක්ව තිබුනු නොයෙක් ප්‍රදේශවලට ගොස් කරුණු එක්රැස් කරමින් සිටියහ. සමඟි පෙරමුණු පාලනයේ මෙහෙයවීම යටතේ සිදු කොට තිබුණු රාජ්‍යමර්දනයේ සැබෑ ස්වරූපය ජාත්‍යන්තර වශයෙන් හෙළි දරව් වෙන්නට පටන් ගෙන තිබිණි. විශේෂයෙන්ම කතරගම දී නිරුවත් කොට මහ පාරේ ගෙන ගොස් වෙඩි තබා ඝාතනයට ලක් කරන ලද ප්‍රේමාවතී මනම්පේරි සහෝදරිය වැනි සිද්ධීන් විදේශ මාධ්‍යවල අවධානයට ලක් විය.

දිවයිනෙන් පිටත්ව යන්නට පෙර ඇවර්බරි සාමිවරයා සහ ප්‍රින්ස් සහෝදරයා වැලිකඩ බන්ධනාගාරයට පැමිණ රෝහණ සහෝදරයා හමු වන්නට නියමිත ව සිටියේය. බන්ධනාගාරයට ඇතුල් වන්නට ඔවුන් සූදානම්ව සිටි අවස්ථාවේ ඔවුන් එසේ කිරීමෙන් වළක්වා ලන ලදි. එවකට අධිකරණ ඇමතිව සිටි ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතාගේ උපදෙස් අනුව යමින් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ව සිටි නිහාල් ජයවික්‍රම මහතාගෙන් නියෝග ලැබී තිබුණි. එවකට බන්ධනාගාර කොමසාරිස් ව සිටි ජේ පී දෙල්ගොඩ මහතා ප්‍රින්ස් සහෝදරයාටත් ඇවර්බරි සාමිවරයාටත් බන්ධනාගාරයට ඇතුල් වීම තහනම් කළේය. එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ව සිටි ප්‍රින්ස් සහෝදරයාට හැත්තෑවේ දශකය තුල පවා බන්ධනාගාරයට ඇතුල් වන්නට ඉඩකඩ නොදීමෙන් විදහා දැක්වූයේ එවකට පැවති ආණ්ඩුවේ අත්තනෝමතික ස්වභාවය යි. අත්තනෝමතිකත්වයට එරෙහිව මානව අයිතීන් රැක ගැනීම වෙනුවෙන් ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා දැක්වූ කැපවීම සහ අධිෂ්ඨානය එබඳු ය.

1977 දී පාර්ලිමේන්තු දේශපාලනයෙන් සමුගත් ප්‍රින්ස් සහෝදරයා සමාජ හා ජාතික ප්‍රශ්නවලට නොබියව මුහුණ දුන්නේය. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පණත අහෝසි කිරීම හේතුවෙන් නිදහස ලබා සිටි රෝහණ සහෝදරයාටත් මටත් 1978 දී පමණ ප්‍රින්ස් සහෝදරයාගේ කොළඹ පිහිටි නිවසේ දී ඇවර්බරි සාමිවරයා හමු වන්නට අවස්ථාව ලැබුනේය. ප්‍රින්ස් සහෝදරයා මගින් ඔහුගේ කොළඹ නිවසේ දීම එකල විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයකු ව සිටි මහාචාර්ය වල්පොල රාහුල ස්වාමීන් වහන්සේ හමුවී සාකච්ඡා කරන්නට අපට අවස්ථාව ලැබුණි. වල්පොල රාහුල ස්වාමීන් වහන්සේ ද ඇවර්බරි සාමිවරයා සමඟ සමීපව සම්බන්ධව සිටියේය.

ලංඩන් නුවර "ගිණි පුපුර'' කණ්ඩායම ජනතා විමුක්ති පෙරමුණ හා සමඟ සම්බන්ධ වන්නේ හැත්තෑව දශකයේ මුල් කාලයේ දියත් කොට තිබුනු දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය තුලිනි. "ගිණි පුපුර'' කණ්ඩායමේ අචා ද ලැනරෝල් සහ සී අයි ප්‍රනාන්දු යන සහෝදරවරු රත්මලාන දුම්රිය අංගනයේ වෘත්තීය අංශයේ කටයුතු කළ අල්විස් සහෝදරයා සමඟ සම්බන්ධ කොට ඇත්තේ ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා යි. ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන වැඩ කටයුතු කර ගෙන යන විට දී මෙන්ම ගාල්ල සංවර්ධන සභාවට මා තරඟ කල අවස්ථාවේ දී ද ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා මට ඔහුගේ කතළුව මහ ගෙදර නැවතී කටයුතු කරන්නට අවසථාව ලබා දුන්නේය. 1982 පැවැත්වූ ජනාධිපතිවරණ ව්‍යාපාරයේ දී ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලය වශයෙන් ඔහුගේ කොළඹ නිවස යොදා ගන්නට ඔහු සිය කැමැත්තෙන් ම ඉඩ ලබා දුන්නේය.
මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවැත්වුණු එකම ජාතික ජනමත විචාරණය වූ ලාම්පු කලගෙඩි සෙල්ලම පවත්වන ලද්දේ 1982 අග භාගයේ දී ය. ඒ ජනමත විචාරණය පවත්වන ලද්දේ පාර්ලිමේන්තු කාලය තවත් වසර 6 කින් දීර්ඝ කර ගැනීම සඳහා ය. අනෙක් විරුද්ධ පක්ෂ සියල්ලම පාහේ සමඟ එක්ව අපි පාර්ලිමේන්තු කාලය දික් කර ගැනීමට එරෙහිව මෙම ජනමත විචාරණයේ දී කටයුතු කලෙමු. ජේ ආර් ජයවර්ධන ජනාධිපතිවරයාගේ මැදිහත් වීම සහිතව රජයේ ආධාරකරුවෝ ඡන්ද නීති බරපතල ලෙස උල්ලංඝනය කරමින් කටයුතු කළ අතර, මැතිවරණ කොමසාරිස් වරයා ගෙන් හා පොලිසියෙන් එම නීති විරෝධී මැතිවරණ කටයුතු වළක්වන ලෙස කරන ලද අපේ ඉල්ලීමට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. එසේ වුවද, විරුද්ධ පක්ෂයට එරෙහිව නීතිය අකුරට ම ක්‍රියාත්මක කෙරුණේය. මෙම ජනමත විචාරණයට විරුද්ධ වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ඇත්ත පුවත්පත් කාර්යාලය සීල් තබා වසා දමන ලද අතර විජය කුමාරතුංග සහෝදරයා ද ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් කොටස් නක්සලයිට් කුමන්ත්‍රණයකට සැරසෙන බව පවසා අත්අඩංගුවට ගන්නා ලදි. පක්ෂ කාර්යාලවලට කඩා වැදී ලිපි ලේඛන පවා අත්අඩංගුවට ගෙන තිබිණි.
දැඩි මැර බලය හා රාජ්‍යබලය යොදවා ලබා ගත් ජනමත විචාරණ ප්‍රතිඵලවලට අනුව ලාම්පුව වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් ලක්ෂ තුනකට අධික ප්‍රමාණයක් ලබා ගෙන තිබුණේය. ඒ අනුව, පාර්ලිමේන්තුවේ නිල කාලය 1989 අගෝස්තු දක්වා දීර්ඝ කරන ලදී. 1975 දී සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුව ද පාර්ලිමේන්තුව තවත් වසර දෙකකින් දීර්ඝ කර ගැනීමට කටයුතු කොට තිබුනු බැවින් විරුද්ධ පක්ෂයේ ඇතැම් සාමාජිකයෝ මෙම ජනමත විචාරන ප්‍රතිඵලයට විරුද්ධ වෙන්නට නොහැකිව දෙගිඩියාවෙන් පෙළුණහ. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක් මගින් ජනමත විචාරණයේ ප්‍රතිඵල අභියෝගයට ලක් කරන්නට ඉදිරිපත් වූයේ ජනතා විමුක්ති පෙරමුණ පමණි. ඊට නායකත්වය දුන්නේ රෝහණ සහෝදරයා යි. අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර සහෝදරයා සහ හිටපු අධිකරණ ඇමති නීතිඥ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා මේ නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටියහ. මෙය ජේ ආර් ජයවර්ධන ජනාධිපතිවරයාට මහත් හිසරදයක් බවට පත් වී තිබිණ. මැතිවරණ දූෂණ හා වංචා පිළිබඳ සාක්ෂි ජනතා විමුක්ති